**ශීර්ෂය 183 - මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය.**

---

**විගණන විෂය පථය**

---

මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 18 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 **විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.229,505,850 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.226,297,277ක් උපයෝජන කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,208,573ක් හෙවත් සියයට 1.4ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 63,264,700 | 62,406,797 | 857,903 | 1.36 |
| මූලධන | 166,241,150 | 163,890,480 | 2,350,670 | 1.41 |
| එකතුව | 229,505,850 | 226,297,277 | 3,208,573 | 1.40 |

**(ii) අයවැය විචලනය**

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 49 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා සත්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 18301 | 3,000,000 | 2,610,473 | 300,000 | 1,386,872 | 7,000,000 | 3,773,414 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විෂය අංක 18301 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂය රු.590,500 ක් වී තිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 15 දෙනෙකුට අවස්ථා 29කදී එකතුව රු.177,800ක තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, නිලධාරීන් 5 දෙනෙකු විසින් අවස්ථා 9කදී ලබාගත් අතුරු අග්‍රිම මාස 2 ක සිට මාස 6 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශයේ අංක 6000/0000/00/0015/0195/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට රු.836,653ක ශේෂයක් විය.

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 880 | - | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරින් ඇප තැන්පත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | 261,630 | අමාත්‍යාංශයට අයත් සංචිත වාහන 02කට අදාළව දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය සහ 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(i) දරන චක්‍රලේඛය. | - | අමාත්‍යාංශය සතු සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| **(ඇ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා** | | |
| 2004 මැයි 12 දිනැති අංක 04/0427/020/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | 465,520 | විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය කර්තව්‍යන් රාජ්‍ය මාධ්‍ය ආයතන මඟින් ඉටුකරවා ගත යුතු වුවත්, අමාත්‍යාංශය විසින් පෞද්ගලික ආයතන මඟින් එම කාර්යයන් ඉටු කරවාගෙන තිබුණි. |

## 1.5 කාර්යසාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු කාර්යයන් අතරින් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස කාර්යසාධන වාර්තාවේ සඳහන්ව තිබූ මහජනයාගේ ප්‍රයෝජනය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ තොරතුරු ජාලයක් ගොඩනැගීම හා ක්‍රියාත්මක කිරීමත්, යහපාලනය පිළිබඳ රාජ්‍ය ආයතන දැනුවත් කිරීමත් යන කාර්යයන් ඉටු කිරිමට සමාලෝචිත වර්ෂයේදී කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ජන සෙතට ජන හවුල ප්‍රජා සත්කාරක ජංගම සේවාවන් 04 ක් පැවැත්වීම සඳහා රු.මිලියන 3.4 ක් වැයකර තිබුණි. එම සේවාවේදී ඉදිරිපත් කර තිබූ ගැටළු 15,265 න් ගැටළු 11,696 ක් සඳහා විසඳුම් ලබාදී තිබුණි. විසඳුම් ලබාදී නොතිබුණු ගැටළු සංඛ්‍යාව 3,567ක් වූ අතර එය සේවාවේදී ලැබී තිබුණු මුළු ගැටළු සංඛ්‍යාවෙන් සියයට 23.38 ක ප්‍රමාණයක් වී තිබුණි. ඊට අමතරව අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු ගැටළු 101 කින් ගැටළු 15 කට පමණක් විසඳුම් ලබාදී තිබූ අතර විසඳුම් ලබාදී නොතිබුණු සංඛ්‍යාව සියයට 85 ක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.43,142,082 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණත්, එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

## 1.6 කළමනාකරණ දුර්වලතා

අනියම් කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අනියම් කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමේදී පැමිණීමේ ලේඛනය වෙනුවට පැමිණීමේ මාසික සාරාංශ පදනම් කරගෙන නිලධාරීන් 12 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.3,195,991 ක් වැටුප් ගෙවා තිබුණි. නිලධාරීන් 03 දෙනෙකු විසින් වැටුප් ලබාගත් බවට අත්සන් කර තහවුරු කර නොතිබුණි. එමෙන්ම අදාල නිලධාරියා

වෙනුවෙන් වෙනත් නිලධාරියෙකු විසින් වැටුප් ලබා ගැනීමේදී ඉදිරිපත් කරන "පොදු 38" ආකෘති පත්‍ර සම්පූර්ණ කර ගැනීමකින් තොරව වැටුප් ගෙවා තිබුණි.

(ආ) අනියම් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකු සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර 2013 අප්‍රේල් 14 දින හැර වසරේ සෑම දිනක් සඳහාම වැටුප් ගෙවා තිබුණි. අදාල නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු විසින් වැටුප් ලබා ගත් අවස්ථාද නිරීක්ෂණය විය.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 04 | 02 |
| (ii) | තෘතීයික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 36 | 23 | 13 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 09 | 03 |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත්) | 08 | 06 | 02 |
| | **එකතුව** | **64** | **44** | **20** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 20 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.